**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**11 ශ්‍රේණිය**

**8.0 ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**8.1 ව්‍යාපාරයක වෙළෙඳ ගිණුම පිළියෙල කරයි.**

**8.2 ව්‍යාපාරයක ලාභාලාභ ගිණුම පිළියෙල කරයි**

**පැවරුම 01**

1. ගිණුම්කරණ ක්‍රියාවලියේ නිමැවුම කුමක්ද?
2. තනිපුද්ගල ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය හා මූල්‍ය තත්ත්වය ගණනය කරනු ලබන ලේඛන පිළිවෙලින් සඳහන් කරන්න.
3. මල්ෂිකාගේ ව්‍යාපාරයේ 2020.12.31 න් අවසන් වර්ෂය තුළ දත්තයන් පහත දක්වා ඇත.

| | රු | | රු |
|---|---|---|---|
| අත්පිට ගැනුම් | 78 000 | ණයට විකුණුම් | 65 000 |
| ගෙන ඒමේ කුලී | 7 000 | ණයට ගැනුම් | 40 000 |
| ලද වට්ටම | 5 000 | අත්පිට විකුනුම් | 150 000 |
| ගෙනයාමේ කුලී | 10 000 | 2020.01.01.තොගය | 15 000 |

❖ කාලච්ඡේදය අවසානය වන විට ව්‍යාපාරයේ සියලුම තොග විකුණා ඇත.
අවශ්‍ය වන්නේ.

1.2020.12.31 න් අවසන් වර්ෂය සඳහා පහත වටිනාකම් ගණනය කරන්න.

- විකිණීමට ඉදිරිපත් කල භාණ්ඩවල පිරිවැය
- විකුණුම් පිරිවැය
- දළ ලාභය

4. නෙත්මිගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා ගිණුම්පොත් වලින් උපුටා ගත් ශේෂ කිහිපයක් පහත දැක් වේ.

| | රු | | රු |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 400 000 | ලද වට්ටම් | 5 000 |
| ණයට විකුණුම් | 95 000 | යන්ත්‍රවිකුණුම් ලාභ | 5 500 |
| ගැනුම් | 100 000 | දුන් වට්ටම් | 4 200 |
| 2020.01.01 තොගය | 12 500 | 2020.12.31 තොගය | 20 000 |
| අත්පිට විකුණුම් | 208 000 | ගෙන ඒමේ කුලී | 4 000 |
| රක්ෂණ ගාස්තු | 5 000 | ලද කොමිස් | 4 800 |
| වෙළෙඳ සේවක වේතන | 22 000 | බැංකුණය පොළි | 6 000 |
| බොල්ණය | 4 200 | මුදල් වංචා අලාභ | 7 000 |
| විදුලි වියදම් | 15 800 | පරිපාලන වේතන | 35 000 |
| ආයෝජන ආදායම් | 9 300 | බැංකු ගාස්තු | 2 000 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 1 500 | ගොඩනැගිලි කුලී | 18 000 |

අවශ්‍ය වන්නේ

1.නෙත්මිගේ ව්‍යාපාරයේ 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙල කරන්න.